ජනතාව සහභාගි කරවීමේ ආමන්ත්‍රණ, දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගයන් සහ තානාපති කාර්යාල සහ ජාත්‍යන්තර මාධ්‍ය සහ මානවවාදී කාර්යාල ඉදිරිපිට විරෝධතා ජාත්‍යන්තර දිනයට පෙර සතිය තුළ පැවැත්වීම සඳහා අපි ආමන්ත්‍රණය කරමු.

**ඉන්දියාවේ මහජන යුද්ධයට සහය දීමේ ජාත්‍යන්තර කමිටුව**
**2014 දෙසැම්බර් 5**
**තොරතුරු සඳහා සම්බන්ධවන්න:**
**csgpindia@gmail.com**
**නව බ්ලොග් අඩවිය (ඉංග්‍රීසියෙන්):**
**icspwindia.wordpress.com**

---

ඉන්දියාව පුරා නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සාක්ෂාත් කර ගැනීම සඳහා වන සන්නද්ධ ජනතා අරගලයක් දියත් වන අතර එය ඉන්දියාවේ ප්‍රාන්ත 20 කට අධික ගණනක පැතිර පවතී. මේ සන්නද්ධ මහජන යුද්ධයට නායකත්වය දෙනු ලබන්නේ ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) මගිනි. එය අද ලෝකයේ තිබෙන බලවත්ම සහ විශාලතම කොමියුනිස්ට් පක්ෂය වන අතර අනාගත සමාජවාදී ජනරජයක අරුණළු පහල වෙමින් තිබේ. රතු කොරිඩෝව ලෙසින් හඳුන්වන නැගෙනහිර ඉන්දියාවේ තමිල්නාඩුවේ සිට නේපාල දේශ සීමාව දක්වා ඉන්දියාවේ තුනෙන් එකක පමණ භූමි ප්‍රදේශය ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) හි පාලනයට නතු වී තිබේ. ඉන්දීය ජනතාවගේ මේ වීරෝධාර ශ්‍රේෂ්ඨ අරගලය ආරක්ෂා කර ගැනීම ලොව පුරා සිටින විප්ලවවාදීන්ගේ සහ ප්‍රජාතන්ත්‍රවදීන්ගේ සහ ප්‍රගතිශීලීන්ගේ උරමත වැටී ඇති කාලීන කර්තව්‍යයකි. මේ වන විට ලෝක නිර්ධන පංති විප්ලවයේ මූලස්ථානය ඉන්දියාව බවට පත්ව ඇත. එහි පිටිසර බද ගම් බිම් වලින් සහ වන පෙත් වලින් එහි හොඳම දූ පුතුන් සිය රුධිරය වගුරුවමින් ගෙන යන ඓතිහාසික අරගලයේ රණ හඬ ලොවට පැතිරී යයි. එක්සත් ජනපදය ඇතුළු ලෝකයේ බලවත්ම අධිරාජ්‍යවාදීන්ගේ සහය සහ උපදෙස් ඇතිව ඉන්දීය පාලක පංතිය එම අරගලය මිලේච්ඡ ලෙස මර්ධනය කිරීමට ධවල භීෂණයක් එම ප්‍රදේශවල ගෙන යන අතර නොසැලී සිටිමින් මාඕවාදී මහජන විමුක්ති ගරිල්ලා හමුදාවේ සහෝදර සහෝදරියෝ එයට ප්‍රතිචාර දක්වති. ජනවාරි 25 දින ජාත්‍යන්තර දිනය ලොව පුරා කොමියුනිස්ට්වරුන්ගේ එක්සත්කමින් කැඳවනු ලැබූයේ අඳුරු සිර මැදිරි තුළ සිර කොට තිබෙන ජනතාවාදී අරගලකරුවන් නිදහස් කර ගැනීමටයි.

**ලංකාවේ මාඕවාදී ලීගය සමග සම්බන්ධවන්න:**
**http://liberationbase.wordpress.com**
**slradical@ymail.com**



# ඉන්දියාවේ සියළුම දේශපාලන සිරකරුවන් කොන්දේසි විරහිතව නිදහස් කරනු!

## *2014 ජනවාරි 25 සහය දැක්වීමේ සහ අරගල කිරීමේ ශ්‍රේෂ්ඨ ජාත්‍යන්තර දිනය!*

ඉන්දියාවෙහි සිර ගෙවල් තුළ 10,000 කට වැඩි මාඕවාදීන් ප්‍රමාණයක් නිකරුණේ කල් ගෙවමින් සිටී, ජාතික විමුක්ති ව්‍යාපාර (කාශ්මීරය, මනිපූර් ආදී) සහ අනෙක් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර වල නියැලුන දහස් ගණන් සිරකරුවන් ඔවුන්ට ඇතුල් කොට තිබේ.




නායකයින්, කාඩර්වරුන් සහ මහජන විමුක්ති ගරිල්ලා හමුදාවේ සාමාජිකයින් හැරුණු විට, 90% වැඩි දෙනා බලෙන් ඉවත් කිරීමට විරෝධය දැක්වූ ආදිවාසී ගම්වැසියන් වේ; අධිරාජ්‍යවාදීන්ට ස්වාභාවික සම්පත් කොල්ලකෑම කරගෙන යෑමට සහ ජනතාව සූරාකෑමට රජය විසින් අත්සන් කළ එකඟතා ගිවිසුම් සහ ප්‍රතිපත්ති වලට එරෙහිව අරගල කළ ගොවියන්; නැගී එන හින්දු වර්ගවාදී ෆැසිස්වාදී තර්ජනයට එරෙහිව සංවිධානය වුණු සුළු ජාතික ක්‍රියාකාරීන්; ඉන්දියානු රජය නිරතවන ජනතාවට එරෙහි යුද්ධයට විරුද්ධව නැගීසිටීමට වරදකරුවන් වූ ශිෂ්‍යයින්, බුද්ධිමතුන්, විප්ලවීය ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ සහ අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානවල කලාකරුවන්, ජනතාවට එරෙහි යුද්ධයේ අවියක් ලෙස සන්නද්ධ සහ පොලිස් බල ඇණි සහ පැරාමිලිටරි ෆැසිස්ට් කණ්ඩායම් රාජ්‍ය අනුග්‍රහය ඇතුව කරනු ලබන මහා පාරිමාණයෙන් සිදු වන ස්ත්‍රී දූෂණයන්ට එරෙහිව එක්සත්ව කැරලි ගැසූ ජනතාවගේ ස්ත්‍රීවාදී කාන්තාවන්.

බන්ධනාගාර තුළ සිරකරුවන් සෑම ආකාරයකටම හිරිහැර කිරීම් වලට, වධ දීම්වලට, ඇප දීම ප්‍රතික්ෂේප කිරීමට, අමානුෂික තත්වයන් යටතේ ජීවත් වීමට, අත්තනෝමතික මාරු කිරීම්වලට, කෲර පහර දීම්වලට, හුදෙකලාව සිරකර තැබීම සහ බොහෝවිට කාන්තා රැඳවියන් දූෂණය කිරීම්වලට ලක් වේ.

සිර අඩස්සියේ ඇති බිහිසුණු තත්ත්වයන් නොතකා විප්ලවීය ආත්මයෙන් යුතුව සිරකරුවෝ විරෝධය දක්වමින් සහ අරගල කරමින් අඳුරු සිරකුටි ඉන්දියාවේ නැගී එන ෆැසිස්ට්වාදයට සහ ඉන්දීය පාලනයට එරෙහි යුධ පෙරමුණු බවට පත් කරමින් සිටී.

ඔවුන්ගේ කොන්දේසි විරහිතව නිදහස් කිරීම පිණිස උදෙසා වන අරගලය සියළු සහයෝගිතා බලවේග සහ ඉන්දියානු ජනතාවගේ මිතුරන්ගේ හදිසි කර්තව්‍යයක්



වන අතර, එය ඔවුන්ගේ විමුක්ති යුද්ධයේ ජයග්‍රහණයට සහය දක්වීම පිණිස අනකුල වූවකි.

එනමුදු මුළු මහත් ඉන්දියාවම පාලක පන්තිය විසින් ''ජනතා ව්‍යාපාරවලට'' සිරකඳවුරක් බවට පත් කිරීමේ යෙදී සිටී.

අධිරාජ්‍යවාදීන්ගේ සහය සහ මගපෙන්වීම ඇතිව 2009 මැදභාගයේ සිට ඉන්දීය පාලක පංතිය සමස්ත රට පුරාම - මාඕවාදී ව්‍යාපාරය මුලිනුපුටා දැමීමට සහ ජනතාවගේ අව්‍යාජ අරගල මර්ධනය කිරීමට ''හරිත දඩයම් මෙහෙයුම'' නමින් හඳුන්වන බහු-දෘති ආක්‍රමණය දියත් කළහ.




මාඕවාදී ව්‍යාපාරය ව්‍යාප්ත වී ඇති අයුරු

පීඩිත ජනතාව කෙරේ මර්ධනය පැටවීම ඕනෑම සූරාකන රාජ්‍යයක ප්‍රමුද්‍රාවක් වෙනවා මෙන්ම එය හැම විටම ඉන්දියානු රජයේ අංගයක්ව තිබේ, හරිත දඩයම් මෙහෙයුම මෙයට පෙර පැවති සියළුම මෙහෙයුම් ප්‍රමාණයෙන් සහ කෲරත්වයෙන් යන දෙවිධියෙන්ම ඉක්මවා ගොස් ඇත.

දහස් ගණන් විප්ලවවාදීහු සහ ප්‍රජාතන්ත්‍රවාදී මහජන සංවිධානවල නායකයින් සහ සාමාජිකයින් ඝාතනය කිරීම්වලට, වධදීම්වලට සහ සිරගත කිරීමට ලක් කොට තිබේ. ව්‍යාජ චෝදනා වලට ලක්ව බොහෝ දෙනා කෲර දඬුවම් වලට මුහුණ දෙමින් සිටී.

සන්නද්ධ බල ඇණි විසින් සමූල ඝාතන, සමූහ දූෂණ, මංකොල්ලකෑම් සහ විනාශ කිරීම් සිදු කිරීම දින චර්යාවක් බවට පත්ව තිබේ.

ජනතාවට එරෙහි යුද්ධය - හරිත දඩයම් මෙහෙයුම - මාඕවාදී ව්‍යාපාරය මුලිනුපුටා දැමීම ඉලක්ක කළද, ජනතාවගේ ඕනෑම අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීමක්, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) සමග සම්බන්ධ යැයි



ජනතා නායකයින් සහ අරගල කරුවන් මධ්‍යම සහ ප්‍රාන්ත රජයේ දූෂ්‍ය නීති වලට අනුව ''දේශ ද්‍රෝහීන්'' සහ ''ත්‍රස්තවාදීන්'' ලෙස හංවඩු ගසයි.

**හරිත දඩයම් මෙහෙයුම නවතා දමනු, ජනතාවට එරෙහි යුද්ධය නවතා දමනු! ඉන්දියානු ජනතාවගේ විමුක්ති යුද්ධය සිය දේශපාලනමය සහ සදාචාරාත්මක සහයෝගය වැඩි කරගන්නවා මිස එය ම්ලේච්ඡ මර්ධනයෙන් නවතා දැමිය නොහැක.**

හැම්බර්ග් ශ්‍රේෂ්ඨ ජාත්‍යන්තර සම්මේලනය සහ සහයෝගය දැක්වීමේ ජාත්‍යන්තර කමිටුව සංවිධානය කළ ජාත්‍යන්තර දින ක්‍රියාකාරකම් ඇතුළු විවිධ ජාත්‍යන්තර මුලපිරීම් සහ ප්‍රයත්නයන් ඉන්දියානු ජනතාව සමග සහයෝගය ගොඩ නැගූ අතර ඔවුන්ගේ විමුක්තිය සඳහා වූ අරගලයට සහය ලබා දුන්හ. මේ මුලපිරීම්



මහජන විමුක්ති හමුදාවේ සහෝදරවරු සීරුවෙන්

ලෝකය පුරා සහ ඉන්දියාව තුළ ද බලපෑම් ඇති කළ අතර, අධිරාජ්‍යවාදයට සහ ඉන්දීය පාලනයට පහර ගැසූහ, අද ප්‍රතික්‍රියා දැක්වීම් වශයෙන්, පළමුවෙන්ම යුරෝපයේ රජයන්ගෙන් සහයෝගිතාවයන් සඳහා වන මුල පිරීම් නවත්වා දමන ලෙස ඉල්ලමින් සිටී.

එම නිසා වෙන කවරදාකටවත් වඩා සහයෝගීතාවය පුළුල් කිරීම අද අවශ්‍යව තිබේ.

එම නිසා ඉන්දියාවේ දේශපාන සිරකරුවන් කොන්දේසි විරහිතව නිදහස් කිරීමේ අරගලයට සහය දැක්වීමට 2014 ජනවාරි 25 වන දින විශාල ජාත්‍යන්තර දිනයක් ලොව පුරා හැකි හැම තැනකම පැවැත්වීමට, ජාතික මට්ටමින් සහයෝගිතා බලවේග සහ කොමිටි මගින් තීරණය කරන ලද හැකි සෑම ආකාරයකටම, වීදි ක්‍රියාමාර්ගයන්,